# දාබිඳු

පුවත්පතක් වශයෙන් ලියාපදිංචි කර ඇත

ආරම්භය 1984

39 වන කාණ්ඩය | 05 වන කලාපය | 2023 මැයි කලාපය


# ජාත්‍යන්තර කම්කරු දින සැමරුම





මෙවර ජාත්‍යන්තර කම්කරු දින සැමරුම වැඩකරන ජනතාවගේ ඒකාබද්ධ මැයි දින රැළිය හා පාගමන වෘත්තීය සමිති, කම්කරුවන්, ධීවරයින්, වෘත්තිකයින්, ගොවියන් හා අනෙකුත් බහුජන සංවිධාන ඒකාබද්ධව කොළඹ පී.ඩී. සිරිසේන ක්‍රීඩාංගනයේදී පැවැත්විණි. මේ සඳහා දාබිඳු සාමූහික සංගමය නියෝජනය කරමින් කටුනායක හා බියගම නිදහස් වෙළඳ කලාප වල සාමාජික සාමාජිකාවන් සම්බන්ධ වූ අතර දාබිඳු සාමූහික සංගමයේ ප්‍රථම ජාත්‍යන්තර කම්කරු දින සැමරීම ද මෙය විය.

මෙහිදී වර්තමාන අර්බුද හමුවේ අයිතීන් වෙනුවෙන් එක්සත් වීමේ වැදගත්කම, වැඩකරන ජනතාවට එරෙහි රාජ්‍ය මර්දනය හා ආර්ථික අර්බුදය හමුවේ ජනතාව මත එල්ල වී ඇති ජන පීඩනය පිළිබඳ අවධානය යොමු විය.

පසුගිය ජන අරගලයෙන් පසුව මර්දන නීති අවභාවිත කරමින් ජනතා පෙළ ගැස්ම දුර්වල කිරීමට නව මර්ධන නීති සම්මත කිරීමට එරෙහිව සංවිධානාත්මක නැගී සිටීමේ වගකීම ජනතාව සතු බවද මෙහිදී විවිධ වෘත්තීය සමිති තම අදහස් ඉදිරිපත් කිරීම් වලදී ඉස්මතු විය.

**මෙහිදී පහත සඳහන් ඉල්ලීම් ඉදිරිපත් කරන ලදි.**

- **රටින් ධනය අයථා ලෙස පිට කිරීම නවතනු පිටකළ ධනය වහා ගෙනෙනු.**

2 වන පිටුවට...

**ඇතුළු පිටු**


**03 පිටුව** - රාජ්‍ය අත්තනෝමතික ක්‍රියාවන් සමාජ කතිකාවත

**04 පිටුව** - වෙළඳුන් රජකරන පාරිභෝගික සමාජය

**06 - 07 පිටුව** - අපේ වැඩ

**09 පිටුව** - විදෙස් විත්ති / බොඳු රටක මිනිස් හැසිරීම් කොයිබට ද?

**10 පිටුව** - සිතුවිල්ල / ප්‍රහේලිකාව

**11 පිටුව** - සුව සහ රූව

## ඩාබිඳු සාමුහිකය

221, වෙළඹඩ පාර, කටුනායක
දුර : 011 4 851 383
ඊ. මේල් : dabindu.infoco@gmail.com
Facebook : dabindu collective sri lanka
Web : www.dabinducollective


# ආර්ථිකයේ කොඳු නාරටිය වූ ඇඟළුම් කර්මාන්තය කඩා වැටේ

පසුගිය දශක කිහිපයකට ඉහත දී ලංකාවේ ආර්ථිකයේ කොඳු නාරටිය වූයේ ඇඟළුම් කර්මාන්තය වූ අතර එම නිෂ්පාදන ක්‍රියාවලියේ නියමුවන් වූයේ රටේ තරුණ ක්‍රියාශීලී කාන්තාවන් ය. වසර 2020 සිට මේ වනවිට කම්කරුවන්ට ඔවුන්ගේ වෘත්තීය ජීවිතයට කනකොකා හඬන්නට පටන් ගත්තේ කොවිඩ් වසංගතය හා ආර්ථික අර්බුදය හේතුවෙනි. හාම්පුතාට වන සියලු අභියෝගයන්ගෙන් මිදීමට කම්කරුවන් වෙත ඍජු ලෙසම එහි අලාභ දැරීමට සිදු කිරීමයි. වැටුප් කප්පාදු, වැටුප් සොරකම් කිරීම අතිකාල අහිමි කිරීම, සේවය කප්පාදු කිරීම්, ආයතන වසා දැමීම, සුබ සාධන පහසුකම් ඇතුළු නිෂ්පාදන ඉලක්ක ඉහළ දමමින් රැකියාව තුළ අධික පීඩනයක් දරමින් සේවය කිරීමට සිදු වීම වැනි බරපතල ලෙස අර්බුදයන්ට මුහුණ දීමට සිදු විය.


මේ තත්වයන් තුළ ලෝකයේ විශේෂයෙන් අප ඇඟළුම් අපනයනයන් වැඩි වශයෙන් සිදු කරන බටහිර ලෝකයේ රටක් වන ඇමරිකාවේ පවතින ආර්ථික අර්බුද නිසා ඇනවුම් 25%කින් පමණ අඩු වී ඇති බව කර්මාන්තකරුවෝ පවසති. එය කඩා වැටීමේ අර්බුදයට විශේෂයෙන් හේතු වුව ද වර්තමානයේ ලිහිල් නීති හඳුන්වා දීමට රජය පවසන පරිදි ආයෝජකයින් දිරි ගැන්වීම බලපාන ඇත්ත තත්වයක් නොවේ. අපට පෙනෙන පරිදි ස්ථාවර නොවූ බදු ප්‍රතිපත්ති හා විදුලි බිල ඉහළ නැංවීම වැනි කාරණා කාර්මාන්තය රඳා පවත්වා ගැනීමට හාම්පුතාට දැරිය යුතු පිරිවැය පිළිබඳ ගැටළුව ප්‍රධාන කාරණාවක් වන බව යතාර්ථය වුවද මේ මුවාවෙන් හාම්පුතා ආකර්ෂණය කොට කම්කරුවා වල පල්ලට ඇද දමන නිතී, රෙගුලාසි පැනවීමට ගන්නා උත්සාහය නීති විරෝධී හා ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවලියකි. අර්බුදය මුවාවෙන් කර්මාන්තශාලා වසා දැමීමට බලා සිටින ව්‍යාපාරිකයන්ට පහසුවෙන් ගැලවී යාමට මාවත් විවර කර දීමක් මිස එය ආයෝජන ආකර්ෂණය කිරීමට ගන්නා උත්සහයක් නොවේ.

1 පිටුවෙන්... **ජාත්‍යන්තර කම්කරු දින**

- ජනතාව මර්දනයට ගෙනෙන PTA ATA හකුලා ගනු
- මහජන දේපල විකිණීම වහා නවතනු
- උතුරේ හා දකුණේ ජනතාවගේ ඉඩම් කොල්ලය වහා නවතනු
- උද්ධමනයට සරිලන ජීවන වියදම් දීමනාවක් ලබා දෙනු
- රාජ්‍ය මර්දනය වහා නවතනු
- කම්කරු නීති සංශෝධනය හකුලා ගනු
- IMF යෝජනාවලට ETF, EPF බිලි නොදෙනු
- අසාධාරණ බදු සංශෝධනය කරනු
- “Express Pearl” වන්දිය ලබා ගනු
- ලිංගික ශ්‍රමිකයන්ගේ අයිතීන් තහවුරු කරනු
- පාලකයින් ඇතිකරන වාර්ගික ආගමික භේද පිටුදකිමු
- පරිසර සංහාරය වහා නවතනු
- Ratify C-189 & C-190
- රජය ඇතුළු සියලුම ආර්ථික අපරාධකරුවන්ට දඬුවම් දෙනු
- අත්‍යවශ්‍ය සේවා නම් කරමින් වෘත්තීය අයිතීන් මර්දනය නවතනු
- ගොවි ජනතාවගේ ඉඩම් කොල්ලය වහා නවතනු
- පළාත් පාලන සහ පළාත් සභා මැතිවරණ වහා පවත්වනු
- අතුරුදන් වූවන්ට යුක්තිය ඉටු කරනු
- IMF සහ ආණ්ඩුවේ ව්‍යාජ සමාජ ආරක්ෂණය වෙනුවට සැබෑ සමාජ ආරක්ෂණයක් ඇති කරනු
- රැකියා සුරක්ෂිතභාවය තහවුරු කිරීම, සමාජ ආරක්ෂණය සඳහා පියවර ගනු
- ප්‍රකාශනයේ භාෂණයේ නිදහස තහවුරු කරනු
- සියල්ලන්ගේම අධ්‍යාපන සහ සෞඛ්‍ය අයිතීන් තහවුරු කරනු
- රට තුළ පවතින ඖෂධ හිඟයට විසඳුම් දෙනු








# රාජ්‍ය අත්තනෝමතික ක්‍රියාවන් පරාජය කිරීමට ඩාබිඳු සාමූහික සංගමය මඟින් සංවිධානය කරන ලද සමාජ කතිකාවත

පවතින රජය ආයෝජන දිරි ගැන්වීම, නම්‍යශීලී වූ කම්කරු නීති ප්‍රතිසංස්කරණය මුවාවෙන් ශ්‍රමය සූරා කෑම තීව්‍ර කිරීමට සහ හාම්පුතුන්ට රිසි සේ සේවකයින් පාලනය කිරීමට හැකි වන පරිදි නව නීති සකස් කිරීමට පියවර ගෙන ඇත. කෝවිඩ් වසංගතය හමුවේ රැකියා අහිමි වීම් වලට මුහුණ දුන් කම්කරු ප්‍රජාවට ආර්ථික අර්බුදයන් හමුවේ කබලෙන් ලිපට වැටීමට සිදු විය. එවන් අවස්ථාවක, රජය උත්සාහ දරන්නේ, පැය අටක වැඩ මුරය අහෝසි කරමින් කම්කරු සේවිකාවන් සඳහා පැවති ආරක්ෂණ නීති ඉවත් කරමින්, අතිකාල දීමනා අහෝසි කරමින්, කාලාන්තරයක් තිස්සේ ව්‍යාපාරික ප්‍රජාවට බාධාවක් ලෙස සැලකූ කම්කරු නීති අවලංගු කිරීමටයි. එසේම GSP + බදු සහන ලැබීමට ද මෙම නීති ප්‍රතිසංශෝධනය මඟින් බාධාවන් පැමිණීම වැළැක්විය නොහැක. එමෙන්ම, ප්‍රති-ත්‍රස්ත පනත මඟින් සංගමයේ නිදහස සහ සාමූහික කේවල් කිරීමට ඇති ව්‍යවස්ථාපිත අයිතිය අමු අමුවේ උල්ලංඝනය කර ඇත. රජයේ මෙවැනි අත්තනෝමතික ක්‍රියාවන් පරාජය කිරීම සඳහා සමාජ කතිකාවක් ගොඩනැඟීම ඉතාමත් කාලෝචිතය.

ඩාබිඳු සාමුහික සංගමය විසින් "නූතන වහල් ශ්‍රම ක්‍රමය පරාජය කරමු" යන මැයෙන් 2023 මැයි මස 24 වන දින ප.ව.2.00 සිට 5.00 දක්වා කොල්ලුපිටිය රේණුකා සිටි හෝටල් පරිශ්‍රයේ සමාජ කතිකාවක් සංවිධානය කරන ලදි. මෙම සමාජ කතිකාවතෙහි ආරාධිත දේශකයන් ලෙස නීතිඥ ලක්මාලී හේමචන්ද්‍ර මෙනවිය, ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥ ජයන්ත දෙහිඅත්තගේ මහතා සහ ආචාර්ය සේපාලි කෝට්ටේගොඩ මහත්මිය සහභාගී වූහ. කාන්තා අයිතිවාසිකම් සහ කම්කරු අයිතිවාසිකම් වෙනුවෙන් සෑම විටම මැදිහත්වන වන ස්වාධීන කම්කරු නීතීඥවරියක වන ලක්මාලී හේමචන්ද්‍ර මෙනවිය කම්කරු අයිතිවාසිකම් සහ නීති ප්‍රතිසංශෝධනය පිළිබඳ දේශනය සිදු කරන ලදි. ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥ ජයන්ත දේහිඅත්තගේ මහතා ප්‍රති-ත්‍රස්ත්‍ර පනත පිළිබඳ දේශනය සිදු කරන ලදි. කාන්තාව සහ මාධ්‍ය සාමූහිකයේ වැටුප් රහිත සුරැකුම් වැඩසම්බන්ධයෙන් සමාජ කතිකාවතක් ගොඩ නැගූ ආරම්භක කාන්තා නායකත්වයක් ලෙස ආචාර්ය සේපාලි කෝට්ටේගොඩ මහත්මිය වැටුප් රහිත සුරකුම් ආර්ථිකය පිළිබඳ දේශනය සිදු කරන ලදි. ඩාබිඳු සාමූහිකයේ විධායක අධ්‍යක්ෂකතුමිය වන චමිලා තුෂාරි මහත්මිය ඇඟළුම් ක්ෂේත්‍රයේ වර්තමාන තත්ත්වය පිළිබඳ කෙටි දේශනයක් සිදු කළ අතර, කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපය නියෝජනය කරමින් පැමිණි කම්කරු සේවිකාවක් ද, බියගම ආයෝජන ප්‍රවර්ධන කලාපය නියෝජනය කරමින් පැමිණි කම්කරු සේවිකාවක් ද, එම ආයෝජන කලාප වල පවතින ගැටලු පිළිබඳව අවධානය යොමු කරවන ලදී.

නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනවිය රජය, සේවකයා සහ සේවා යෝජකයා අතර පවතින එකඟත්වයෙන් නීති සම්පාදනය සහ සම්මුතීන් ගොඩනැගීම පිළිබඳ දක්වා තම දේශනය ආරම්භ කළ අතර නීති මඟ හැරීමට තිබෙන අවස්ථා අවම කිරීම සහ කර්මාන්ත සුහදව පවත්වා ගෙන යාම පිළිබඳව මෙහිදී අවධානය යොමු කරන ලදී. එපමණක් නොව ජාතික කම්කරු උපදේශක සභාව සමඟ කටයුතු කර එකඟත්වයෙන් නීති සම්පාදනය මඟහැර වර්තමානයේ ද්වීපාර්ශවීය මූලධර්මය යොදා ගනිමින් නව නීති සම්පාදනය පිළිබඳව කටයුතු කළ අතර ත්‍රෛපාර්ශවීය ක්‍රියාවලිය බිඳවැටී ඇති ආකාරය ඉතා පැහැදිලිව

8 වන පිටුවට...



# වෙළඳුන් රජකරන පාරිභෝගික සමාජය

අද ඔබත් මමත් ජීවත්වන්නේ පාරිභෝගික සමාජයකය. පාරිභෝගික සමාජයක් යනු පාරිභෝගිකයාට වාසිදායක සමාජයක් නම් නොවේ. පාරිභෝගිකයා වංචාවෙන් හෝ නොමඟ යැවීමෙන් නිෂ්පාදකයා හෝ වෙළෙන්දා මුදල් ගරා ගන්නා ආර්ථික සමාජයකි. ජන ජිවිතයේ බොහෝ දේවල් ඉතා පහසුවෙන් ඉටුකර ගත හැකියැයි යන නොමඟ යවන තෘප්තියකින් ඔබ මේ සමාජයේ ජීවත් වන්නාහ. ඔබගේ සිත බොරුවෙන් හා වංචාවෙන් යම් යම් පාරිභෝගික භාණ්ඩ මිලදී ගැනීමට පෙලඹවීම ඔබට හොරා ඉතා සූක්ෂවම මෙම වෙළඳ සමාජය විසින් සිදු කරමින් සිටී.

සමාජයේ මිනිසෙකුට ජිවත්වීමට අත්‍යවශ්‍ය කරුණු හතරකි. ආහාර, ඇඳුම් පැළඳුම්, බෙහෙත්හේත් හා වාසස්ථාන වෙයි. සාමාන්‍ය ජීවිතයට අවශ්‍ය මෙම අවශ්‍යතා, අවම මට්ටමින් සපුරා ගැනීම සැහේ. එහෙත් වෙළඳ සමාජය විසින් එය උපරිම මට්ටමින් සහ අවශ්‍යතා ඉක්මවා යන මට්ටමින් මිල දී ගැනීමේ උවමනාව අපට ඇති කරවනු ලැබේ. මේ සඳහා වෙළඳ සමාජය උපයෝගිකර ගත්තේ පෘතග්ජන සිත්තුළ පවත්නා අනුත්පරා ඉස්මතු වීම අනුන් ගලවා තමන්ව උසස් ජීවන තත්වයක සැළකීම වැනි ඡාගර සිත්තුළ ඇති වන ලඳ බොළඳ හැගීම් ගොන්නකි. මේ සඳහා නිෂ්පාදකයන් සහ වෙළඳුන් විවිධ උපක්‍රම භාවිතා කරයි. දෛනික මෝස්තර රටා වලින් ජනයා රැවටීම තිත්සාර සහ බොළඳ වෙළඳ ප්‍රචාරණය, තෑගි දීම හරහා පාරිභෝගිකයා අද්දවා ගැනීම, පාරිභෝගිකයා මනෝරාජික ලෝකවල රැඳවීම වැනි උපක්‍රම එහිදි නිතර නිතර භාවිතා කෙරේ.

මේ සියල්ල සඳහා වැය කරන කෝටි ප්‍රකෝටි ධනය නැවත පාරිභෝගිකයාගෙන්ම උදුරා ගන්නා බව පාරිභෝගිකයාට වසංකර තිබේ. දිව පිනවන රසයට ඇස රවටන පියකරු නිමාවට සිත රවටන සමාජයේ කැපී පෙනීමට යට කෝටි ප්‍රකෝටි ධනස්කන්දය වැසි ගොසිනි.

ආර්ජන්ටිනාවේ බුවනෝර්ස් අරෝස් විශ්ව විද්‍යාලයේ නීති සිසුන් අමතා කියුබා නායක පිදෙල් කැස්ටෝ පැවැත්වූ දේශනයකදි පාරිභෝගික සමාජය ගැන මෙසේ සඳහන් කළේය.

**පාරිභෝගික සමාජය යනු සංවර්ධනය ධනවාදය විසින් සොයාගනු ලැබූ විෂමතව දෙයකි. ආහාර, නිවාස, ඇඳුම්, ප්‍රතිකාර ජීවත්වීමට අවශ්‍යයි. එහෙත් ජිවිතයේ ගුණාත්මක බව ඊටත් වඩා වටිනවා. දැනුම සමඟ සංස්කෘතිය තුලයි ජිවිතයේ ගුණාත්මක බව රැඳී තිබෙන්නේ.**

පාරිභෝගික සමාජය නිෂ්පාදනය කෙරෙන්නේ පාරිභෝගික ඉල්ලා සිටින භාණ්ඩවලට වඩා වෙළඳුන් විසින් පාරිභෝගිකයා පොළඹවා (මිලදී ගැනීමට) ගනු ලබන භාණ්ඩ හා සේවාවේ ඒ අනුව, වෙළඳ සමාජයක ඉල්ලුම සද්භාවමය ඉල්ලුමක් නෙවේ. වෙළඳුන් විසින් තල්ලුකළ ඉල්ලුමකි. මෙහිදී වැදගත් වන්නේ භාණ්ඩයක ගුණාත්මක බව නොවේ, ආකර්ශයයි පිට වැසිමයි.

ඇස රවටන වර්ණ රටාවයි. ඉන් සපුරාලන්නේ පාරිභෝගික උපයෝගිතාවට වඩා ව්‍යාපාරික උපයෝගිතාවයි. මෙම භාණ්ඩ පාරිභෝජනය කිරීමෙන් පාරිභෝගිකයාට රසකාරක හරහා නොදන්නා ලෙඩ රෝග ද නිෂ්පාදකයා විසින් ලබාදේ. එය තවත් සූරා කෑමකට පාරිභෝගික ලක්කරයි. චැනල් සේවා සහ ඖෂධ ජාවාරම්කරුවන්ට ආදායම් උපයාදීමක් ද අතුරු ඵලයක් වශයෙන් සිදු කෙරේ. ඒ අනුව පාරිභෝගික සමාජය එක භාණ්ඩ වර්ගයක් ලබා දී දෙවරක් සූරාකෑමට ලක් කරයි.

මෙවැනි වෙළඳ සමාජයක පාරිභෝගික අණපනත්, නීතිරීති, මිල පාලනය අවම වශයෙන් කුඹුරක පඹයෙකුගේ කාර්යවත් ඉටු නොකරයි.

මයිකල් සුකෝට අනුව ධනවාදී සමාජයක දී වෙළඳ පල පාලනය කිරීමට රජයට හැකි වූවද, නව ලිබරල්වා දී සමාජයකදී වෙළඳුන් විසින් රජය පාලනය කරයි. අද ලංකාව ඇතුළුව ලොවපුරා සිදුවන්නේ මෙය නොවේද?

පෙතියාගොඩ සිරි ෆොන්සේකා




# ඇඟළුම් කම්කරු කණ්ඩායම් කොටස් මිලදී ගැනීම්වලට එරෙහිව සටන් කරයි

රටවල් හතක ඇඟළුම් කම්කරු කණ්ඩායම් කොටස් මිලදී ගැනීම්වලට එරෙහිව සටන් කරයි. සිරියාවේ සහ එක්සත් ජනපදයේ රටවල් හතක ඇඟළුම් කම්කරු සංගම් සහ සංවිධාන එක්සත් ජනපදය පදනම් කරගත් බිග් ෆැෂන් සමාගම් විසින් වසර ගණනාවක් නොගෙවූ වැටුප් ඉල්ලීම් වලින් පසු කොටස් මිලදී ගැනීම් නතර කරන ලෙස බල කිරීමට එකතු වී ඇත.

මෙම සතියේදී, සංවිධාන 50කට අධික සංඛ්‍යාවක් සහ ඔවුන්ගේ සහචරයින් වන Asia Floor Wage Alliance (AFWA) සහ Global Labour Justice-International Labour Rights Forum (GLJ-ILRF) එක්ව Nike සිය සැපයුම් දාමයේ සේවකයන්ට දළ වශයෙන් USD මිලියන 9.3ක් ගෙවන ලෙස ඉල්ලා ඇත.

මෙය පැමිණෙන්නේ (AFWA) ජාත්‍යන්තර සම්බන්ධීකාරක, අනන්‍යා බතර්තාර්ජී එක්සත් ජනපද කොන්ග්‍රස් නියෝජිතයන් වන Jesús "Chuy" García (L-04 & Ro Khanna" (CA-17 සහ Val Hoyle OR-04) විසින් සංවිධානය කරන ලද මාධ්‍ය සාකච්ඡාවක කතා කිරීමෙන් දින කිහිපයකට පසුවය.

සේවක ප්‍රතිලාභ පනත නැවත හඳුන්වාදීම මත, කොටස් මිලදී ගැනීම් තහනම් කිරීමට නීති සම්පාදනය කිරීම. මෙය කලින් කම්කරුවන්ගේ බලය උදුරාගත් සහ සමාගම්වල සාක්කුවලට මුදල් දැමූ නීතිවිරෝධී ආකාරයකි.

2021 දී, Nike ( සිය කොටස් මිලදී ගැනීමේ සැලසුම් වැඩි කළ අතර නව USD බිලියන 18 ක ආපසු මිලදී ගැනීමේ සැලැස්මක් (පෙර වඩා ඩොලර් බිලියන 3 වැඩි) අනුමත කළේය. එම මුදලින් Nike සැපයුම් දාමයේ සේවකයන්ට ඔවුන්ගේ වැටුප මෙන් 2000 ගුණයක් ගෙවීමට ඔවුන්ට හැකියාව තිබුණි.

ආසියානු ඇඟළුම් වෘත්තීය සමිති AFWA - GLJ-ILRF සහ අනෙකුත් සංවිධාන Nike වෙතින් ඉල්ලා සිටින්නේ:

1. **කාන්තා සේවිකාවන්ට ඇති විශේෂිත බලපෑම් ඇතුළුව කොවිඩ් වැටුප් ඉල්ලීම් පිළිබඳ විධිමත් පරීක්ෂණයක් සඳහා ඇඟළුම් සේවකයින් සහ ඔවුන්ගේ වෘත්තීය සමිති සමඟ සම්බන්ධ වන්න**
2. **සියලුම ඇඟළුම් සේවකයින්ට අහිමි වූ වැටුප් ආපසු ගෙවන තෙක් ලාභාංශ සහ කොටස් මිලදී ගැනීම බිලියනවලින් ගෙවීම නවත්වන්න.**
3. **සියලුම කම්කරුවන්ට ජීවන වැටුප් ගෙවීමට ඔවුන්ගේ ගෝලීය සැපයුම් දාමය වෙනස් කරන්න.**

**සස්කා සාජහාන්**

# මානසික සෞඛ්‍යය දැනුවත් කිරීමේ මාසය

ගෝලීය වශයෙන්, මානසික අවපීඩනය සහ කලබල වීම වාර්ෂිකව වැඩ කරන දින බිලියන 12 ක් අහිමි වන බව වාර්තා වන අතර ගෝලීය ආර්ථිකයට ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 1 කට ආසන්න මුදලක් වැය වේ.

මේ සඳහා අපගේ දායකත්වය කුමක්ද? අපිට කල හැක්කේ මොනවද?

වැළැක්වීමේ ප්‍රයත්නයන් හරහා මානසික සෞඛ්‍යය ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට ක්‍රියා කිරීම සහ කළමනාකරුවන් සඳහා ඵලදායී පුහුණුවක් ඇතුළුව ආයතනික ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි වැඩිදියුණු කිරීම, මානසික සෞඛ්‍ය තත්වයන් ඇති පුද්ගලයින්ට ඔවුන්ගේ වෘත්තීය ජීවිතය තුළ ඉදිරියට යාමට උපකාර කිරීම, මෙවැනි කටයුතු සිදුකිරීමෙන් අපට සේවා ස්ථානවල යුක්තිය පිළිබඳ සංස්කෘතියෙන් පිරුණු පරිසරයක් නිර්මාණය කළ හැකිය.

බෙටර් වර්ක් ශ්‍රී ලංකා (Better Work Sri Lanka) විසින් දැනට ජාතික වැඩසටහනක් සංවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්තය ආශ්‍රිත මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම (MHWB) දර්ශනය සිතියම්ගත කරමින් සිටී. අපි දැන් MHWB හි ජාතික මැදිහත්වීම් පවත්වා ගැනීම සඳහා උපදේශන මාලාවක් අවසන් කර ඇති අතර එය සඳහා කෙටුම්පත් මාර්ග සිතියමක් ද සකස් කර ඇත.

**සුජා**

# වෙසක් දන්සැල





මෙවර වෙසක් පොහොය නිමිතිකොට ගෙන ඩාබිඳු සාමූහිකය විසින් සිය සාමාජික සාමාජිකාවන් හා එක්ව පාන් දන්සැලක් ඩාබිඳු පරිශ්‍රයේ දී සිදු කෙරුණි.

ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක J.A.P. උදයංග මහතාගේ නිරීක්ෂණය මත දන්සැල, නිදහස් වෙළඳ කලාප වල සේවය කරන කම්කරුවන්ට පවතින ආර්ථික අර්බුදයට සහනයක් වූ බව ද, ඩාබිඳු සාමූහිකය තුළ එම ක්‍රියාවලිය පිළිබඳ ප්‍රදේශවාසීන්ගේ ද පැසසුමට ලක් විය. දහසකට අධික පිරිසක් දන්සැල සඳහා සහභාගී විය. මෙය ඩාබිඳු සාමූහිකය විසින් ප්‍රථම වරට පවත්වනු ලැබිණි.








# මලෙයගම් - 200

ක්‍රි.ව.1823 දී මලයාලම් දමිළ ජනයා බෝට්ටු වල නැගී ඉන්දියන් සමුදුර තරණය කර, ලංකාවට පැමිණ මෙම වසරට එනම් 2023ට වසර 200 ගත වීම මෙහිදී සංකේතවත් කරන ලදි.

සමාජ සංවර්ධන ආයතනය විසින් සංවිධානය කළ මලෙයගම් 200 නුවරඑළිය සිනෙස්ටා ශ්‍රවනාගාරයේ දී ආරම්භක අවස්ථාවේ දී දෙදහසකට අධික පිරිස් සහභාගිත්වයකින් යුතුව සම්මන්ත්‍රනයක් සහ රේස්කෝස් පිටියේ ප්‍රදර්ශණය 2023 මැයි මස 19 වන දින පැවති අතර, 20 සහ 21 යන දෙදින පුරාත් මහත් උත්කර්ෂවත් අයුරින් විවිධ වැඩසටහන් පැවැත්විණි. මලයාලම් දමිළ ජනයාගේ උරුමයන් පිළිබඳ පැමිණි පිරිසට මනා අවබෝධයක් ලබා ගැනීම සඳහා ඔවුන් භාවිත කළ ඇඳුම් ආයිත්තම්, වාද්‍යභාණ්ඩ වැනි ඔවුන් භාවිත කළ විවිධ උපකරණ වලින් මෙම ප්‍රදර්ශණය සමන්විත විය.

වතුකරයේ ජනතාව තුලින් පාර්ලිමේන්තුවට සහ පලාත් සභාවට තේරී පත් වූ මහජන නියෝජිතයින් සෑම දෙනෙකුම පාහේ මලෙයගම් 200 වැඩසටහනේ දි අදහස් දක්වන ලදි.

වසර 200 ගත වුවද, අදටත් ඔවුන් මුහුණපාන සමාජ, ආර්ථික, දේශපාලන ගැටළු වලින් පෙළීම නැවතී නැත. අදටත් ඔවුන් ජීවත් වන ලැයිම් කාමර වලට ලිපිනයක් නැත. ශ්‍රමයට සරිලන වැටුපක් ද ලැබෙන්නේ නැත. දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා ගැනීමට පාසලක් නැත. ගමනාගමන පහසුකම් නැත. රොටියක් කා වේල සරිකර ගන්නා ඔවුන් අදටත් තමන්ගේ මූලික අයිතිවාසිකම් පිළිබඳ දැනුමක් නොමැත.

මෙදින ද දේශපාලකයන් විවිධ පොරොන්දු දී ඔවුන්ගේ සැප වාහන වලින් පිටත් ව ගිය අතර දේශපාලකයන් ගේ පොරොන්දු වලට අත්පුඩි ගසමින් සිටි ඔවුන් ඊට පසු දින සිට නැවතත් සුපුරුදු දින චර්යාව පටන් ගැනීම සඳහා බස් රථ වලින් තමන්ගේ ගම් බිම් බලා පිටත් ව යන ලදි.

නදීශානි මහබණ්ඩාර



# රොෂෙන් ශානකගේ 12වන ගුණ සැමරුම

අර්ථ සාධක මංකොල්ලයට එරෙහිව 2011 වසරේ දියත් වූ කම්කරු අරගලයේ දී පොලිස් පහරින් මියගිය රොෂේන් ශානක සොයුරා සිහිකිරීමට අවස්ථාව මෙවර 01/06/2023 දින කටුනායක ඇවරිවත්ත ඔරලෝසු කණුව අසල දී සිදුවිය.

තවමත් අයුක්ති සහගත ලෙස වෙඩි තබා මරා දැමූ, සදාකාලික අබ්බගාත වූ පිරිසට සාධාරණයක් ඉටු නොවීම නිසාද, නීතිපති දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යන සාක්ෂි විමසුම මීගමුව ඉහල උසාවියේ සිදුවෙමින් පවත්නා බැවින්ද, ඉහත සැමරුම මෙවර කටුනායක දී සිදු කෙරුණි.

මෙම සිදුවීමට වසර 12ක් ගතවුවද අදටත් ඉටුවූ යුක්තියක් නොමැත. තවමත් ප්‍රමාද ඒ යුක්තිය වෙනුවෙන් සහ කම්කරු අයිතිවාසිකම් කප්පාදු කරමින් ගෙන එන නීති ප්‍රතිසංස්කරණවලට එරෙහිව නිදහස් වෙළඳ කලාප කම්කරුවන්ගේ සහයෝගීතාවයෙන් මෙය සැමරූ අතර, ඇවරිවත්ත ඔරලෝසු කණුව අසල සිට රොෂේන් සිහිකිරීමේ කටයුත්තේ දී රොෂේන් ශානක සොයුරාගේ මව සහ අතුරුදහන් වූ පවුල් එකතුවේ




බ්‍රිටෝ ප්‍රනාන්දු සහෝදරයා, ශ්‍රමාභිමානි කේන්ද්‍රය සංවිධානයේ සිස්ටර් ක්‍රිස්ටීන් සහ සුගත් සහෝදරයා රෙදිපිළි ඇඟළුම් හා සේවක සංගමයේ ලලිතා සහෝදරිය මෙන්ම, ඩාබිඳු සාමූහිකයේ චමිලා තුෂාරි වැඩ සටහන මෙහෙය වීමට දායක විය. එසේම මෙම වැඩසටහනට වෘත්තීය සමිති නියෝජනය කරමින් සහ තරුණ නීතිඥ සංගමය නියෝජනය කරමින් ලක්මාලි හේමචන්ද්‍ර සහ ස්වස්ථිකා ආරුලිංගම් සහෝදරියන් ද නියෝජනය කෙරුණි.





3 පිටුවෙන්... **රාජ්‍ය අත්තනෝමතික**



දක්වන ලදී. කම්කරු උපදේශන සභාව සමඟ සංශෝධන සාකච්ඡා කිරීමේ සාම්ප්‍රදායික ක්‍රමය භාවිතා කිරීම වෙනුවට අමාත්‍යවරයා වෙනත් කණ්ඩායම් සහ පුද්ගලයින්ගෙන් අදහස් ලබා ගනිමින් සිටී. දැනට හාම්පුතුන්ගේ සංවිධාන කිහිපයක් විසින් පවතින නීති සංශෝධනය කිරීම සඳහා කම්කරු ඇමතිවරයාට යෝජනා ගණනාවක් ඉදිරිපත් කර ඇත. එසේ යෝජනා කරන සංශෝධන කිහිපයක් පහතින්,

- **අවම වන්දි ලබාදී සේවය අවසන් කිරීම**
- **පවතින නීතිය: විනය විරෝධී ක්‍රියාවක් මත පදනම් නොවී සේවය අවසන් කරන විට වන්දි සූත්‍රය යටතේ සේවා කාලය අනුව මිලියන 2.5 කට නොවැඩි වන්දි ලබාගැනීමට සේවකයින්ට අයිතියක් ඇත (6ඍ වගන්තිය සේවකයන්ගේ සේවය අවසන් කිරීමේ පනත, අතිවිශේෂ ගැසට් (2216/17)**
- **යෝජිත ප්‍රතිසංස්කරණය: සේවායෝජකයා කැමති වන්දියක් ලබා දී සේවය අවසන් කළ හැකිය**
- **රැකියා අනාරක්ෂිත කිරීම**
- **පවතින නීතිය: විනය විරෝධී ක්‍රියාවක් මත පදනම් නොවේ නම් සේවකයින් රැකියාවෙන් ඉවත් කිරීමට සේවකයාගේ කැමැත්ත හෝ කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ අවසරය ලබාගත යුතුය (2 වන වගන්තිය, සේවකයින් සේවය අවසන් කිරීමේ පනත)**
- **යෝජිත ප්‍රතිසංස්කරණය: සේවා යෝජකයාගේ තනි තීරණයක් මත සේවකයින් රැකියාවෙන් ඉවත් කළ හැකිය**
- **වැටුප් අනාරක්ෂිත කිරීම**
- **පවතින නීතිය: සේවකයින් ගේ සම්පූර්ණ මූලික වැටුප් ගෙවීමට සේවායෝජකයා බැඳී සිටී. නියමිත පරිදි වැඩ ලබාදීම සේවායෝජකයාගේ වගකීමකි. (22 වන වගන්තිය, පඩිපාලක සභා ආඥා පනත)**
- **යෝජිත ප්‍රතිසංස්කරණය: සේවායෝජකයාට වැඩ සැපිය නොහැකි නම් (වසංගතයක්, අමුද්‍රව්‍ය සැපයීම අඩාල වීම නිසා) සේවකයාගේ රැකියාව තාවකාලික අවසන් කර අර්ධ වැටුප් ලබාදීමට හැකිය**
- **වැඩ දිනය නම්‍යශීලී කිරීම හා අධික ලෙස වැඩ කිරීම සාමාන්‍යකරණය කිරීම**
- **පවතින නීතිය: වැඩ සතිය පැය 15ක් හෝ 48 ක් වන අතර (රැකියාවේ ස්වභාවය අනුව) වැඩ දිනය පැය 8කි. (24 (2) හා 3 (3) වගන්ති, පඩිපාලක සභා ආඥා පනත, 3 වගන්තිය සාප්පු හා කාර්යාල පනත)**
- **යෝජිත ප්‍රතිසංස්කරණය: සතියකට පැය 45/48 ක ට යටත්ව වැඩ දිනය හා වැඩ සතිය නම්‍යශීලී කිරීම. ඒ අනුව දිනකට පැය 12 /14 ක් වැනි ප්‍රමාණයක් නොමැතිව සේවය කළ යුතු වේ**

ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥ ජයන්ත දෙහිඅත්තගේ මහතා සේවය අවසන් කිරීමේ පනත වන්දි සූත්‍රය සහ ප්‍රති ත්‍රස්ත්‍ර පනත සහ ත්‍රස්ත විරෝධී පනත පිළිබඳව අවධානය යොමු කරන ලදී. ප්‍රති ත්‍රස්ත පනත සහ ත්‍රස්ත විරෝධී පනත වර්තමානයේ දී කෙටුම්පත් කිරීම සඳහා අදහස් විමසීමකට ලක් කර ඇති අතර මෙහිදී පනතේ අන්තර්ගතය පිළිබඳ අවභාවිතා වීම දැකිය හැක. වර්තමාන වටපිටාව අනුව ත්‍රස්තවාදය සම්බන්ධයෙන් නීතියක අවශ්‍යතාවය නොපවතින අතර මහජන නැගිටීම් මර්දනය කිරීමේ අරමුණ සහිත බව පැහැදිලියි. තවදුරටත් වෘත්තීය සමිති ක්‍රියාමාර්ග ගැනීමේ ඉඩප්‍රස්ථාව සීමා කර ඇති අතර භාෂණයේ සහ අදහස් ප්‍රකාශනයේ ඉඩප්‍රස්ථාව ද දැඩිව සීමා කිරීම දැකිය හැක. සේපාලි කෝට්ටේගොඩ මහත්මිය වැටුප්රහිත සුරකුම් ආර්ථිකය පිළිබඳ දේශනයදි වර්තමානයේ පවතින නීති සුරකුම් සේවයේ යෙදෙන කාන්තාවන් වෙනුවෙන් සම්බන්ධ නොවීම සහ එහි බලාත්මක නොකිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කරවන ලදී. අවිධිමත් ක්ෂේත්‍රයේ සේවකයන් සම්බන්ධයෙන් නීති බල නොපෑම පිළිබඳව ද විශේෂ අවධානයක් යොමු කරවන ලදී. සාකච්ඡා වට අවසානයේදී පොදු සාකච්ඡාවට අවකාශය විවර වූ අතර විවිධ සිවිල් සමාජ සංවිධාන තම අදහස් බෙදා ගත්හ. ඩාබිඳු සාමූහිකය කාලීන අවශ්‍යතාවයට ඇරඹුණු මෙසේ සටහන් කළ නමුත් එය අත් මෙපමණකින් නොනැවතී තවත් බොහෝ අවස්ථාවල තම මැදිහත්වීම ඍජුව සිදුකිරීම අරමුණයි.

**යසාරා විදුමිණි**

# විදෙස් විත්ති

2013 අප්‍රේල් 24 වැනි දින බංග්ලාදේශයේ ඩකා අගනුවරට පිටතින් පිහිටි තට්ටු අටකින් යුත් රනා ප්ලාසා ගොඩනැගිල්ල කඩා වැටීමෙන් කම්කරුවන් දහසකට වැඩි පිරිසක් මිය ගිය අතර 2,500කට අධික පිරිසක් තුවාල ලැබූහ. ගෝලීය වෙළඳනාම සඳහා ඇඳුම් සාදන කර්මාන්තශාලා තිබූ මෙම ගොඩනැගිල්ලේ ඉරිතැලීම් සොයා ගන්නා ලදී. ඛේදවාචකයට පෙර දින කෙසේ වෙතත්, ගොඩනැගිල්ලේ ස්ථාවරත්වය පිළිබඳ ගරාවැටීම් නොතකා, පසුදින උදෑසන කර්මාන්තශාලා සංකීර්ණයට ඇතුළු වන ලෙසත් නැතහොත් රැකියා අහිමි වන ලෙස ඇඟළුම් සේවකයින්ට දන්වා ඇත.

කෙසේ වෙතත්, ඔවුන්ගේ සැපයුම් දාමයේ සේවක ආරක්ෂාව සඳහා වැඩි වගකීමක් ගත යුතු වෙළඳ නාමවල කැපී පෙනෙන ව්‍යාතිරේක පවතී - විශේෂයෙන්ම ගිවිසුම අත්සන් කිරීම ප්‍රතික්ෂේප කර ඇති Levizs, Gap, Walmart සහ Amazon වැනි එක්සත් ජනපද සමාගම්. මෙවැනි සන්නාමවල අත්සන් තැබීම අනතුරුදායක තත්ත්වයන්ගෙන් තවත් ඇඟළුම් සහ රෙදිපිළි කම්කරුවන් ආරක්ෂා කරනු ඇති අතර එය 2023 ඔක්තෝම්බර් මාසයේදී කල් ඉකුත් වීමට නියමිත බැවින් අලුත් කිරීමේ ගිවිසුම ශක්තිමත් කරනු ඇත.



උපුටා ගැනීම අන්තර්ජාලය ඇසුරිනි.

# බොදු රටක මිනිස් හැසිරීම් කොයිබට ද?



ලෝකයේ උතුම් රට ලංකාව යැයි විරුදාවලිය ලත් අප ජන්ම භූමිය තුළ විවිධ ජාතීන් හා විවිධ ආගම් පක්ෂ භේදයෙන් තොරව තමන් කැමති ආගමක් ඇදහීමට නිදහසේ ජීවත් වීමටද හැකියාවක් තිබුණි.

නමුත් මෑත කාලයේ සිට ජාති කුල ආගම් ප්‍රශ්න මතු වෙමින් ආගමික සහජීවනය දේශපාලන පක්ෂ බෙදවීම නිසා රට තුළ ව්‍යාකුල තත්වයක් හට ගෙන ඇත. මත් උවදුර වැඩිවෙමින් පවතින අතර, නැවත නඩත්තු සංස්කෘතිය හිස ඔසවමින් සිටී. නාඳුනන තුවක්කුකරුවන් විසින් ජීවිත විනාශ වන හැටි දිනපතා මාධ්‍ය තුළින් අසන්නට දකින්නට ලැබේ. බෞද්ධයින් වැඩි පිරිසක් ජීවත්වන අප රට තුල පන්සිල් පද පහවත් රකිනවද? පානාතිපාතා කියා වැන්දට අද මිනිස් ඝාතන, සතුන්ඝාතන කොතරම් සිදුවෙනවාද? අදින්නාදානා වේරමණී සික්තාපදං කීවට අද රට තුළ කොතරම් බොරුව, අනුන්ගේ දේවල් සොරකම් කිරීම, අනුන් සතු දේවල් බොරුව වංචා තුළින් අයිති කර ගන්නවාද? ඉහළ තැන්වල සිට පහල ශ්‍රේණි දක්වා බොහෝ දුරට සිදුවෙනවාද? කාමේසු මිච්චාචාරා කියා වැන්දට කාමයෙන් රාගයෙන් මත් වී, කුඩා දරුවන් පවා මහල්ලන් අතින් ළමා අපචාර වලට ලක්වේ. මුසාවාදා වේරමණී හා සුරාමේරයන් යන පන්සිල් 5 පද තුළ අප කොතරම් දුරට රකිනවාද? මෙය නිසි ලෙස පිළිපදිනවා නම් හිරගෙවල් තුළ මෙතරම් රැඳවියන් සිටින්නේ නැත. මෙවර වෙසක් වලට වඩා පොසන් මස තුල කොතරම් සෙනඟක් සුදු වතින් සැරසී කෙතරම් ආමිස පූජා තිබුනාද, අවම වශයෙන් පන්සිල් පද පහවත් නිසි ලෙස රැකෙනවනම් රට තුළ මෙතරම් සාපරාධී ක්‍රියා නොවන්නේය.

සමන්මලී

# සිතුවිල්ල

පසුගිය මස දිග නිවාඩුවක් ලැබුණු නිසාත්, කාමරයේ සිටී යාළුවෙක් විදෙස් රැකියා සොයා ගිය බැවින් තනිව කාමරයේ පාළුවේ සිටීමට නොහැකි නිසා ගමේ ගියේය.

වෙසක් මස නිසා දෙපස අලංකාර කූඩු තනා තිබුණත් විදුලි ගාස්තු ඉහල ගොස් ඇති නිසා ගෙවල් තුළ ආලෝකයක් එතරම් නොතිබුණි. දන්සැල්වල නම් දිගු පෝලිම් දක්නට ලැබුණි. පෙර කලකදී නම් කොඩිය වනා දන්සැල් තුලට බලෙන් ඇදගෙන යති. දැන් එසේ අවශ්‍ය නැත. ආර්ථිකය මිනිසුන්ට කොතරම් බලපා ඇති හැටි දිගු පෝලිම් වලින් පෙනී ගියේය.

අප මේ ගෙන්දගම් පොළොවේ වැඩ කලත් ලැබෙන වැටුපෙන් ගේම් ගහන හැටි වැටුප් වැඩි වෙනවට වඩා තියෙන දේවලුත් කටින් තමයි.

බඩු මිලත් අඩුවෙනවා වැඩිවෙනවා. විශාල ශ්‍රම බලකායත් අප රට තුළ ජීවත් වෙනවා. එයින් රටේ බුද්ධිමතුන් වැඩි පිරිසක් රට හැර ගියාම ඉතුරු වන්නේ කවුරුන්ද කියා සිතා ගත හැකිය.

මෙදා සැරේ කම්කරු දින දේශපාලන පක්ෂ සැමරුවේ සුපුරුදු පරිදි විවිධ ධජයන් යටතේ අපේ ශ්‍රම බලකාය පිළිබඳ විකල්ප වැඩ සටහන් ගැන නෝ ටෝක්. විවිධ දේශපාලන තුළින් පැමිණි අය එයාලගේ පුරසාරම් දෙඩුවා මිසක එක් මන්ත්‍රී කෙනෙක් අපි ගැන ටිකක් කතා කළා. එහෙත් සාමූහික තත්වයක් එතන නැහැ.

කම්කරු දිනය කියන්නේ මොකක්ද කියලා සමහරු දන්නේ නැහැ. එදා චිකාගෝ නුවර කම්හලක කම්කරුවන් පැය 8 සේවයක් ලබා දෙන ලෙස කළ උද්ඝෝෂණයක දී කළ වෙඩි පහරදී මිය ගිය අයව සිහිකිරීම සඳහාය.

අප රටේ වෙළඳ කලාප තුල සේවය කළ කටුනායක වෙළඳ කලාපයේ කම්කරු පිරිසක් ETF ප්‍රශ්නයේදී එයට විරුද්ධවූ කම්කරුවන් එයට විරුද්ධව කළ අරගලයේදී වෙඩි තැබූ හා පහරදීම් වලදී තුවාල ලැබූ අතර, වෙඩි වැදී මියගිය රොෂේන් සහෝදරයා දැන් බොහෝ අයට අමතක වී ගොස් ඇත. අඩුම වශයෙන් ඔහුව සිහි කිරීම සඳහා ස්මාරකය වත් තනා නැත.

නව නීති අණපනත් සැලසුම් කිරීමට යනවලු. පරණ නීති අයින් කරන්න. තියෙන නීතිද වලපල්ලට යමින් පවතී.

සමන්තා

# ප්‍රහේලිකා අංක - 41

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 1 ක | | 2 හ | | ■ | 3 ප | | | 4 නි |
| ■ | ■ | | ■ | 5 ක | | ■ | ■ | |
| 6 නි | | | 7 න | ■ | ■ | ■ | ■ | |
| | ■ | 8 නි | | | 9 දී | | ■ | ■ |
| 10 වා | | | | | | | 11 ක | ■ |
| | | | | | 12 සු | | | |
| 13 ය | 14 තු | | ■ | 15 මේ | | ■ | | ■ |
| ■ | | ■ | ■ | | ■ | 16 අ | | 17 කෙ |
| 18 ඇ | | ■ | ■ | | ■ | 19 වි | | |

**හරහට**

1. භික්ෂූන් වහන්සේ නමකට ආමන්ත්‍රණය සඳහා යොදන පදයකි.
5. භික්ෂූන් නීති ගරුකව හික්මවීම සඳහා පනවා ඇති නීතිරීති සමූහය.
6. ඉතා හිතවත් යන අරුත් ඇති පදයකි.
7. එකට සමූහය පවතින තරකා සමූහයක් මේ නමින් හැඳින්වේ.
9. කන්තාවක විවාහ කර ගැනීම යන අදහස දෙන පදියකි.
10. එක්තරා ගැමි නාට්‍ය විශේෂයකි.
13. නිෂ්ප්‍රයෝජන කතා බහ.
14. අලුත් යන අදහස දෙයි.

**පහළට**

2. කඩිසර ස්වභාවයෙන් යුක්ත වූ.
3. දවල් කාලයේ මැද භාගය හදුවන්නේ මෙසේය.
4. ස්වාමි පුරුෂයා මරණයට පත් වූ.
8. යම් කිසි ක්‍රියාවක් නිසා උදාවන ප්‍රතිඵල.
11. තොල් යන අරුත දීම සඳහා විශේෂයෙන් සහිත්‍යයෙහි භාවිතයට ගැනෙන පදයකි.
12. අසාවෙන් යුත්.

**මෙම ප්‍රහේලිකාව නිවැරදිව පුරවා මෙම ලිපිනයට එවා තෑගි දිනන්න.**
**ඩාබිඳු සාමූහිකය**
**221, වෙළබඩ පාර, කටුනායක.**

සුව හා රුව



# අදම අරඹමු ඩෙංගු දුරලමු

වර්තමානයේ ජාතික ව්‍යසනයක්ව පවතින ඩෙංගු රෝගය ඔබ අප සැමගේ ජීවිතයට මහත් තර්ජනයක් බවට පත්ව තිබෙනවා.

ජාතික ඩෙංගු මර්දන ඒකකය, වසංගත රෝග විද්‍යා අංශය, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ඇතුළු ආයතන රාශියක් මේ වන විට මෙම තත්ත්වය මැඩ පැවැත්වීම සඳහා විශාල උත්සාහයක නිරත වෙයි. සියලුම රාජ්‍ය සහ පෞද්ගලික රෝහල් කාර්ය මණ්ඩල මෙන්ම ත්‍රිවිධ හමුදාව සහ පොලීසියද මෙම අවස්ථාවේ සිදු කරන මෙහෙවර ප්‍රථමයෙන්ම අප අගය කළ යුතුයි.

ලංකාවේ විතරක් නොවෙයි මේ වන විට ආසියාවේ රටවල් කිහිපයකම මෙම ව්‍යසනය පැතිර ගොස් තිබෙනවා. සාමාන්‍යයෙන් ජුනි- ජූලි මාසවල කඩින් කඩ ඇති වන නිරිතදිග මෝසම් වැසි තත්ත්වය නිසා මෙම ඩෙංගු උවදුර හිස ඔසවන අතර කෙමෙන් එය යටපත්ව ගියද නැවතත් ඔක්තෝම්බර් - නොවැම්බර් මාසවල ඩෙංගු මදුරුවාගේ බෝවීම පැතිර යනවා. නමුත් මෙවර මෙම තත්ත්වය ඉතා දරුණු අතර හැරී තිබීම කණගාටුදායක තත්ත්වයක්.

ඩෙංගු උණ රෝගයේදී එක්වර ඇතිවන තද උණ, අධික හිසරදය හා ඇස පිටුපස වේදනාව, හන්දිවල හා පේශිවල වේදනාව බොහෝ දුරට ඇතිවන අතර සමහර රෝගීන්ට රතු පැහැති විහිදුන ස්වභාවයේ දද සහ සමහර අවස්ථාවලදී ලේ ගැලීමේ තත්වයන් (විදුරුමහෙන්, නාසයෙන්, ශ්ලේෂ්මල පටල හා සමෙන්)

රෝගියා පහත සඳහන් රෝග ලක්ෂණ පෙන්නුම් කරන්නේ නම් (විශේෂයෙන්ම උණ බැස යන අවස්ථාවේ) අනිවාර්යයෙන්ම වෛද්‍ය උපදෙස් ලබා ගත යුතුය.

- **නොනවත්වා වමනය කිරීම**
- **බඩේ කැක්කුම**
- **තද පිපාසය**
- **අධික නිදිමතබව හා සිහිමද ගතිය**
- **ආහාර ප්‍රතික්ෂේප කිරීම**
- **අසාමාන්‍ය ලේ ගැලීම් තත්වයන් උදා: ඔසප් චක්‍රයේදී අධික ලෙස රුධිර වහනයක් සිදුවීම, නියමිත කාලයට පෙර ඔසප් චක්‍රය සිදු වීම**
- **රෝගියා පහත සඳන් රෝග ලක්ෂණ පෙන්නුම් කරන්නේ නම් වහාම වෛද්‍ය උපදෙස් ලබා ගත යුතුය**
- **අත් පා සුදුමැලි හා සීතල බව**
- **නොසන්සුන්බව හා කලබලකාරී බව**
- **සමේ පැහැය වෙනස් වීම**
- **මුත්‍ර පිට නොවීම හෝ මුත්‍ර පිට වීම අවම වීම**
- **හැසිරීමේ වෙනස් කම් - සිහිමද ගතිය/ අසභ්‍ය වචන භාවිතය**

ඉහත කී රෝග ලක්ෂණ ඔබට ද ඇත්නම් පැය 48ක් ඇතුලත රුධිර පරීක්ෂාවක් සිදු කර ගැනීම වඩාත් සුදුසු බව වෛද්‍යවරුන් ලබාදෙන උපදෙසයි. එම වාර්තා සාමාන්‍ය වුවද ඉදිරි 24 පැය තුළදී ද ඔබට යම් සුවයක් හෝ නැතිනම් නැවතත් රුධිර පරීක්ෂාවක් සිදුකර ගැනීම කල යුතුමයි. මෙම ඩෙංගු උවදුර හමුවේ රජය මඟින් පෞද්ගලික ආයතනයකින් කරනු ලබන රුධිර පරීක්ෂණ සඳහා අය කරන ගාස්තුව රුපියල් 250 දක්වා සීමා කර තිබෙනවා. එසේම තම නිවසේ සාමාජිකයෙක් ඩෙංගු උවදුරට ගොදුරු වූ බව දැනගත් වහාම ඒ පිළිබඳව තම ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීයාට දැනුම් දීම අනිවාර්ය බව සළකන්න. මන්ද, ඩෙංගු රකුසාගේ ඊළඟ බිල්ල ඔබ විය හැකියි. නිවැසියෙකුට ඩෙංගු වැලඳෙනවා යනු, ඔබටත් එය වැළඳීමේ ප්‍රවනතාවය ඉතාමත් වැඩි බවයි.

ඒ වගේමයි ඩෙංගු වැළඳුන පමණින් රෝහල්ගත විය යුතුමයි යනුවෙන් ජනතාව තුළ දුර්මතයක් පවතිනවා. නමුත් එය එසේ වන්නේ නැහැ. වෛද්‍ය උපදෙස් අනුව අවශ්‍යය පරිදි ඖෂධ භාවිතා කරන්නේනම් නිවසේ සිටම ඔබට සුව වන්නට පුළුවන්. එසේ නිවසේ සිට සුව කිරීමට නොහැකි තරම් ඔබට අසාධ්‍යයයි නම් වෛද්‍යවරයා විසින් ඔබට රෝහල්ගත වන ලෙස නිර්දේශ කරනු ඇති. අනෙක් අතට ඩෙංගු රෝගය වැලඳුනු පසු පුද්ගලයාගේ රුධිර පට්ටිකා ප්‍රමාණය අතිශයින් පහළ බසිනවා. එය මෙම රෝගයේ සාමාන්‍ය ස්වභාවයක්. එනිසා ඒ පිළිබඳව අනියත බියක් ඇති කරගත යුතු නැහැ. සාමාන්‍යයෙන් රෝගී වී 7 වන දිනය වන විට නැවත රුධිර පට්ටිකා ප්‍රමාණය ඉහළයාම ආරම්භ වනවා. එසේ සිදු නොවුනහොත් වෛද්‍යවරයෙකුගේ උපදෙස් ලබාගත යුතුයි. එසේම මෙහිදී පැරසිටමෝල් හැර අනෙකුත් කිසිදු වේදනා නාශකයක් භාවිතයට ගත නොයුතු බවයි වෛද්‍ය නිර්දේශය වන්නේ.

මාධ්‍යවලින් පවා ඩෙංගු උවදුර පිළිබඳ මේ තරම් ප්‍රචාරණයක් ලබා දෙන්නේ ඔබ සිතනවාටත් වඩා දරුණු ලෙස එනම් ජාතික ව්‍යසනයක ස්වරූපයෙන් මෙම ඩෙංගු රකුසා දිනෙන් දින අහිංසක මිනිස් ජීවිත බිලි ගනිමින් සිටින නිසා. රටේ සියලුම මාධ්‍ය පවා එකට එක් වී තම ලාභ අරමුණු පසෙකලා සිය වාණිජ විකාශන කාලය මෙම ව්‍යසනය පිළිබඳව ජනතාව දැනුවත් කරමින් සිටින යුගයක රටේ ඇතිවූ අන් ව්‍යසනවලදී මෙන්ම මේ අවස්ථාවේදීත් අප සැවොම අවදි වී එකට එක් වී එකා මෙන් හමුදාවක් සේ ක්‍රියාකළ යුතුයි. මෙය ජාතික වගකීමක් යුතුකමක් සේ සිතා අද සිටම ඔබ ඔබෙන් අරඹන්න. ඔබේ නිවස, සේවා ස්ථානය සහ අවට පරිසරය ඩෙංගු මදුරුවාට රජ දහනක් නොකර පිරිසිදුව තබා ගන්න. අදම අරඹමු. ඩෙංගු දුරලමු.

*උපුටා ගැනීම අන්තර්ජාලය ඇසුරෙනි*



# කම්කරු නීති සහ කර්මාන්ත

**පසුගිය** කාලය පුරා ලංකාවේ තැනින් තැන බිහිවන නව ලිබරල් යැයි කියාගන්නා කණ්ඩායම් විසින් කළ යෝජනාවක් වූයේ ලංකාවේ කම්කරු නීති ලිහිල් කිරීම හරහා ලංකාවට ආයෝජන ගලා එනු ඇති බව යි. නොඑසේ නම් ලංකාවට විදේශ ආයෝජන පැමිණීමට ඇති ප්‍රමුඛ බාධකයක් වන්නේ ලංකාවේ පවතින කම්කරු නීති බව යි.

ඒ ඔස්සේම යමින් පසුගිය සති කිහිපයේ දී ලංකාවේ කර්මාන්ත වසා දැමීමට හේතුවක් ලෙස ද මෙම කම්කරු නීති බලපාන බව ඔවුන් ප්‍රකාශ කරන්නට විය.

මේ සම්බන්ධ අපගේ පෙර ලිපියෙන් ද පෙන්වා දුන් පරිදි ලංකාවෙ පවතින වර්තමාන ආර්ථිකය හැකිලවීමේ ප්‍රතිපත්ති මෙන්ම ජාත්‍යන්තර ඉල්ලුමේ ඇති විශාල පසු බැසීමත් සමඟ ඇති වී තිබෙන කර්මාන්ත සඳහා ලංකාව තවදුරටත් ආකර්ෂණීය නොවන පසුබිමක යෝජනා කෙරෙන කම්කරු නීති ලිහිල් කිරීමේ ප්‍රතිපත්තිය ලාංකේය රජය අනුගමනය කළහොත් එය ලංකාවේ කර්මාන්ත ඇවර කිරීමට බලා සිටින බොහෝ ව්‍යාපාරිකයට විශාල සහනයක් වනු ඇත. එනයින් එකී යෝජනා ආයෝජන ගෙනෙන දිශාව වෙනුවට ආයොජකයන් වේගයෙන් ලංකාව හැරයන තැනකට යනු ඇති බව අපගේ විශ්වාසය යි.

මේ මොහොතේ ගතහොත් බොහෝ ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන්නේ අවම ලාබ/ අලාබ තත්ත්වය පවතිද්දී ය. නැවත කර්මාන්ත නගා සිටුවීමට ව්‍යාපාර දැඩි වෙහෙසක් දරන එක් ප්‍රධාන හේතුව නම් ව්‍යාපාර අතහැර යාමට යම් වන්දි ගෙවීම් ඇතුළු දැරිය යුතු පිරිවැයක් තිබීම යි. එසේ නොවන්නට ව්‍යාපාරයක් පාඩු ලබන මොහොතේම ඒවා වසා දමා ලාබ ව්‍යාපාරවලට යොමුවීමට ව්‍යාපාරිකයන් පෙළඹේ. නොඑසේ නම් ආයතනයක් පාඩු ලබන ඕනෑම අවස්ථාවක එම පාඩු දරාගනිමින් ව්‍යාපාරය නැවත ගොඩනගනවා වෙනුවට වැටුප් කප්පාදු කරමින්, රැකියා අහිමි කරමින්, ශ්‍රමය සූරාකමින් හෝ ආයතනය පහසුවෙන් වසා දමමින් ඔවුන්ගේ පාඩු සේවකයන් මතට පටවා දමා ලාබ පමණක් ලබන්නට ව්‍යාපාරවලට අවස්ථා හිමි වේ. එවන් පසුබිමක තවදුරටත් ව්‍යවසායකත්වය යනු ලාබ ලැබීම වෙනුවෙන් අවදානම් දැරීමක් නොවේ.

එමෙන්ම මෙහිදී මතුකළ යුතු කරුණක් වන්නේ එක් අතෙකින් පවතින නීති යටතේ පවා කම්කරුවන් සූරාකෑමට ලක්වීම සුලබ කාලයක අනෙක් පසින් ලෝකය පැය 48 වැඩ මුරයක සිට පැය 36 - 40 වැඩ මුර දක්වා හුවමාරුවන කාලයක, ලෝකයේ Fair Trade" Fair Labour වැනි ප්‍රවර්ණතා මඟින් පාරිභෝගිකයන් තමන්ගේ පරිභෝජන සඳහා ශ්‍රම සූරාකෑමක් සිදුවී නොමැති බව තහවුරු කරගැනීමට සාධාරණ මිලක් ගෙවීමට සූදානම් වෙමින් පවතින දශකයක පුද්ගල නිදහස ගැන පාරම් බානා ලිබරලුන් කම්කරු නීති ලිහිල් කිරීමට යෝජනා කිරීමයි.

මෙවන් මොහොතක ලංකා රාජ්‍ය කම්කරුවන්ගෙ අයිතීන් සුරක්ෂිත කරමින් ලෝකය ඉදිරියේ "ඔබ මිලදී ගන්නා සෑම Made in Srilanka භාණ්ඩයක් ම සේවකයන්ට නිසි මිලක් සහ නිදහසක් ලබා දෙමින් නිපද වූ බවට අප සහතික වෙමු" වැනි තේමාවක් සමඟ ජාත්‍යන්තරයට ගියේ නම් ආයෝජකයන් ආකර්ෂණය කරගන්නවාට වඩා පාරිභෝගික ඉල්ලීම මත ආයෝජනයන් ලංකාව සොයා එන තත්ත්වයක් බිහිකළ හැකි බව අපි දැඩිව විශ්වාස කරමු.

උපුටා ගැනීම "ප්‍රතිවාද" ෆේස්බුක් පිටුවෙනි

අංක: 221, වෙළඹඩ පාර, කටුනායක හි පදිංචි එච්. අයි. සමන්මලී වන මා විසින් මීගමුව රන්වැකි මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදි.